# ECONOMIC GROWTH
# &
# DEVELOPMENT
# (Part-V)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of Sri Jayewardenepura***

# දරිද්‍රතාව

දරිද්‍රතාව යනු යම් පුද්ගලයකුට හෝ පුද්ගල සමූහයකට හෝ යහපත් පැවැත්මක් සඳහා අවශ්‍ය වන සාධාරණ හේතු සහිතව හඳුනාගත් අවම ශුභසාධන තත්ත්වයන්ට ළඟා වීමට නොහැකි වීමයි.

එනම් කිසියම් පරිභෝජන හෝ ආදායම් මට්ටමකට හෝ නිවාස, සෞඛ්‍ය හා අධ්‍යාපන පහසුකම් සහ මානුෂික අවශ්‍යතා හා පවත්නා සමාජ ආර්ථික තත්ත්වයන් මත හඳුනා ගත් රැකියා දේපළ සහ වෙනත් අයිතිවාසිකම් භුක්ති විඳීමේ අවම මට්ටමකට ළඟා වීමට නොහැකි වීමයි.

දරිද්‍රතාව, දුඃඛිතභාවය, විහීනතාව, බලරහිත වීම, බැහැර කිරීම, දුප්පත්කම, දිළිඳුකම යන නම්වලින් ද හැඳින්වේ.

Classwork.LK

# දරිද්‍රතා සංකල්ප

දරිද්‍රතාව විවිධ සංකල්ප ඔස්සේ විග්‍රහ කළ හැකිය.

දරිද්‍රතාව මැනීම සඳහා පහත සඳහන් දර්ශක යොදා ගනී.

- ජාතික දරිද්‍රතා ඉම
- ජනගහන දරිද්‍රතා දර්ශකය
- ජාත්‍යන්තර දරිද්‍රතා ඉම
- වෙනත් දරිද්‍රතා දර්ශක
- මානව දරිද්‍රතා දර්ශකය
- පාරිභෝජන දරිද්‍රතා දර්ශකය
- දරිද්‍රතා අන්තර් දර්ශකය
- බහුමාන දරිද්‍රතා දර්ශකය

Classwork.LK

## ජාතික දරිද්‍රතා ඉම

ජාතික දරිද්‍රතා ඉම යනුවෙන් අදහස් කරනුයේ මූලික අවශ්‍යතා සඳහා වැඩි වන වියදම පදනම් කර ගත් ක්‍රමවේදයට අනුව දෛනික ඒක පුද්ගල ආහාරමය ශක්ති පරිභෝජන අවශ්‍යතා සහ ආහාර නොවන අත්‍යවශ්‍ය පරිභෝජන අවශ්‍යතා යන අවශ්‍යතාවන් සපුරා ගැනීමට අදාළව නිශ්චිතව පිහිටුවා ඇති නිරපේක්ෂ දරිද්‍රතා රේඛාවකි.

මෙය ගණනය කරනු ලබන්නේ පුද්ගලයකුට මසක අවම වශයෙන් කායික ශක්තිය පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය කරන කැලරි ප්‍රමාණය මිල දී ගැනීම සඳහා වැය කරන වියදමක් ආහාර නොවන අත්‍යවශ්‍ය අවශ්‍යතා සඳහා වැය කරන මුදලක් සැලකිල්ලට ගැනීමෙනි.

දියුණු පුද්ගලයකුට දිළිඳු බවින් මිදීමට අවශ්‍ය කරන අවම පෝෂණ මට්ටම ළඟා කර ගැනීමට අවශ්‍ය ආදායම් ජාතික දරිද්‍රතා ඉම වශයෙන් හඳුන්වයි.

(මේ අනුව ශ්‍රී ලංකාවේ එක් පුද්ගලයකුට දිනකට කිලෝ කැලරි 2030 ක් අවශ්‍ය බව ගණන් බලා ඇත).

Classwork.LK

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මිල වෙනස් වීම් සඳහා යාවත්කාලීන කොට මාසිකව ජාතික දරිද්‍රතා ඉමෙහි වටිනාකම මූර්ත අගයක් ලෙස ප්‍රකාශයට පත් කරයි.

මෙම ජාතික දරිද්‍රතා ඉමට වඩා අඩු ආදායමක් උපයන පුද්ගලයන් දිළින්දන් වශයෙන් හඳුනා ගැනේ.

Classwork.LK

# ජනගහන දරිද්‍රතා දර්ශකය

ජනගහන දරිද්‍රතා දර්ශකය යනු දරිද්‍රතා ඉමට පහළින් සිටින දිළිඳු ජනගහන ප්‍රමාණය මුළු ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස දැක්වීම යි.

ජනගහන දරිද්‍රතා දර්ශකය ගණනය කිරීම සඳහා පහත සඳහන් සූත්‍රය යොදා ගනී.

$$\text{ජනගහන දරිද්‍රතා දර්ශකය} = \frac{\text{දරිද්‍රතා ඉමට පහළ සිටින ජන කොටස}}{\text{මුළු ජනගහනය}} \times 100$$

2015 වර්ෂයේ සංවර්ධනය වෙමින් පවතින රටවල් සම්බන්ධයෙන් දිනකට ඇමරිකානු ඩොලර් 1.9 කට වඩා අඩු ආදායමකින් දිවි පෙවෙත රැක ගන්නා ජන අනුපාතය වෙන් කර දක්වන රේඛාව ජාත්‍යන්තර දරිද්‍රතා ඉම යනුවෙන් හැඳින්වේ.

2015 වර්ෂයේ දියුණු රටවල් ජාත්‍යන්තර දරිද්‍රතාව ගණනය කිරීමේදී දිනක ආදායම ඇමරිකානු ඩොලර් 2.5ට අඩු අදායම් ලබන ජන සංඛ්‍යාව යොදා ගනී.

වර්තමානයේ ලෝකයේ රටවල දරිද්‍රතාව අඩු වෙමින් පවතින බවක් පෙනී යයි.

Classwork.LK

## දරිද්‍රතාව මැනීම සඳහා භාවිත කරන වෙනත් දරිද්‍රතා දර්ශක

දරිද්‍රතාව මැනීම සඳහා භාවිත කරන වෙනත් දරිද්‍රතා දර්ශක කීපයක් පහත දැක්වේ.

- මානව දරිද්‍රතා දර්ශකය
- පරිභෝජන දරිද්‍රතා දර්ශකය
- දරිද්‍රතා අන්තර් දර්ශකය
- බහුමාන දරිද්‍රතා දර්ශකය

## මානව දරිද්‍රතා දර්ශකය

මානව දරිද්‍රතා දර්ශකය යනු ජීවත් වීමට ප්‍රමාණවත් ආදායමක් නොමැතිකම වැනි පටු සංකල්පයකට වඩා පැතිකඩ කිහිපයක් සහිත පුළුල් සංකල්පයකි.

පුද්ගලයෙකුට අර්ථවත් ජීවිතයක් ගත කිරීම සඳහා ඇති තේරීම් හා ඉඩ ප්‍රස්තා අහිමි වීමත් මානව දරිද්‍රතාව යන්නෙන් අදහස් කෙරේ.

Classwork.LK

## මානව දරිද්‍රතාව මැනීමේ ප්‍රධාන පැතිකඩ

එක්සත් ජාතින්ගේ සංවිධානය මානව දරිද්‍රතාව මැනීම සඳහා ප්‍රධාන පැතිකඩ 3ක් සැලකිල්ලට ගනී.

1. දීර්ඝ හා සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් නොමැති වීම
2. යහපත් ජීවන තත්ත්වයක් නොලැබීම
3. දැනුම නොමැති වීම

**මානව දරිද්‍රතා දර්ශකයෙහි ස්වරූප දෙකකි.**

- සංවර්ධනය වන රටවල් සඳහා සැකසෙන මානව දරිද්‍රතා දර්ශකය
- සංවර්ධිත රටවල් සඳහා සැකසෙන මානව දරිද්‍රතා දර්ශකය

Classwork.LK

## පරිභෝජන දරිද්‍රතා දර්ශකය

අවම දෛනික ඒක පුද්ගල ආහාරමය ශක්ති පරිභෝජන අවශ්‍යතා හා ආහාර නොවන අත්‍යවශ්‍ය පාරිභෝජන අවශ්‍යතා ප්‍රමාණයන් මැන දැක්වීම පරිභෝජන අවශ්‍යතා දර්ශකයෙන් සිදු කෙරේ.

ආහාර හා ආහාර නොවන නිශ්චිත පාරිභෝජන අවශ්‍යතා ප්‍රමාණයන් පදනස කර ගනිමින් කාලයත් සමඟ එහි පිරිවැයෙහි වෙනස සලකා බලා ඒ අනුව දරිද්‍රතාවයේ වෙනස්කම් විශ්ලේෂණය කිරීම මෙම දර්ශකය මගින් සිදු කෙරේ.

## දරිද්‍රතා අන්තර් දර්ශකය

දිළිඳු පුද්ගලයකුට පරිභෝජන දරිද්‍රතාවයෙන් මිදීමට අවශ්‍ය වන මුදල් ප්‍රමාණය (හිඟ මුදල් ප්‍රමාණය) දරිද්‍රතා අන්තර් දර්ශකය යන්නෙන් අදහස් කෙරේ.

$$\text{දරිද්‍රතා අන්තර් දර්ශකය} = \frac{\text{දිළිඳු පුද්ගලයකුගේ මුළු මාසික පරිභෝජන වියදම}}{\text{දරිද්‍රතා රේඛාවේ අගය අතර වෙනස}}$$

දිළිඳු අයකුගේ දරිද්‍රතා අන්තර් දර්ශකයේ අගය 0 ලෙස සලකා මෙම දර්ශකය පිළියෙල කෙරේ.

Classwork.LK

## බහුමාන දරිද්‍රතා දර්ශකය

ආදායම පදනම් කර ගත් සරල මිනුමක් ඔස්සේ දුගී භාවය මිනුම් කරනවා වෙනුවට කුටුම්බ මට්ටමේදී පුද්ගලයන්ට මුහුණ පෑමට සිදු වන විවිධාකාර වූ හිඟතාවන් පදනම් කර ගෙන දරිද්‍රතාවය මිනුම් කිරීම බහුමාන දරිද්‍රතා දර්ශකයෙන් සිදු වේ.

සෞඛ්‍ය, අධ්‍යාපනය, ජීවන තත්ත්වය යන පුළුල් ක්ෂේත්‍ර තුනට අදාළ විහීනතාවන් 10ක් පාදක කර ගනිමින් බහුමාන දරිද්‍රතා දර්ශකය පිළියෙළ කර ඇත.

මෙම විහිනතා සියල්ල කැටි කරන ලද විහීනතා දර්ශකයේ අගය 30% ඉක්මවා ඇති කුටුම්බ දිළිඳු කටුම්බ ලෙස හඳුනා ගැනේ.

ජනගහන දරිද්‍රතා දර්ශකය හා විහීනතා දර්ශකය යන දෙකෙහි සාමාන්‍ය අගයන් එකිනෙකින් ගුණ කරමින් බහුමාන දරිද්‍රතා දර්ශකය ලබා ගනී.

| |
|---|
| බහුමාන දර්ද්‍රතා දර්ශකය = ජනගහන දරිද්‍රතා දර්ශකය x විහීනතා දර්ශකය |

Classwork.LK

# දරිද්‍රතාවේ ස්වරූප

**දරිද්‍රතාවේ ස්වරූපතාවේ ස්වරූප දෙකකි.**

1. නිරපේක්ෂ දරිද්‍රතාව
2. සාපේක්ෂ දරිද්‍රතාව

## <u>නිරපේක්ෂ දරිද්‍රතාව</u>

නිරපේක්ෂ දරිද්‍රතාව යනු කිසියම් පුද්ගලයකුට හෝ කුටුම්බයකට මූලික අවශ්‍යතා සපුරා ගැනීමට ප්‍රමාණවත් ආදායමක් නොලැබෙන තත්ත්වයකි.

ජාතික දරිද්‍රතා ඉම හා ජාත්‍යන්තර දරිද්‍රතා ඉම මගින් පෙන්වනුයේ නිරපේක්ෂ දරිද්‍රතාව යි.

Classwork.LK

## සාපේක්ෂ දරිද්‍රතාව

සාපේක්ෂ දරිද්‍රතාව යනු ආදායම් ව්‍යාප්තියේ විෂමතාව හේතුවෙන් ඇතැම් ජන කොටස්වලට අනෙකුත් ජන කොටස්වලට සාපේක්ෂ ව අඩු ආදායමක් ලැබෙන තත්ත්වයකි.

අඩු ම ආදායම් ලබන 40%ට මුළු ආදායමෙන් කොපමණ ප්‍රමාණයක් හිමි වේ ද යන්න මෙහි දී සලකා බැලේ.

සාපේක්ෂ දරිද්‍රතාව ආදායම් විෂමතාව තුළින් ඇති වන දරිද්‍රතාවකි.

Classwork.LK

# දරිද්‍රතාවයේ පැතිකඩ

## දරිද්‍රතාවයේ පැතිකඩ දෙකකි.

1. පරිභෝජන දරිද්‍රතාව ( ආදායම් දරිද්‍රතාව)
2. මානව දරිද්‍රතාව

## පරිභෝජන දරිද්‍රතාව

පරිභෝජන හෙවත් ආදායම් දරිද්‍රතාව යනු අවම ජීවන තත්ත්වයක් සඳහා අවශ්‍ය කරන පරිභෝජන මට්ටම පවත්වා ගෙන යාමට ප්‍රමාණවත් ආදායමක් නොලැබීමයි.

පරිභෝජන දරිද්‍රතාවයේ පැතිකඩ දෙකකි. එනම් නිරපේක්ෂ දරිද්‍රතාව හා සාපේක්ෂ දරිද්‍රතාවයි.

පරිභෝජන දරිද්‍රතාව මනිනු ලබන්නේ පෝෂණ මට්ටමෙනි. පෝෂණ මට්ටම මනිනු ලබන්නේ දෛනික ආහාර වේලක අඩංගු කැලරි ප්‍රමාණය හා ප්‍රෝටීන් ප්‍රමාණය මත ය.

Classwork.LK

ලෝක සෞඛ්‍ය සංවිධාන ඇස්තමේන්තුවලට අනුව වයස අවුරුදු 20-30 අතර පුද්ගලයෙකුට දිනකට කැලරි 2500ක් ප්‍රෝටීන් ග්‍රෑම් 53ක් පමණ ද අවශ්‍ය වේ.

නමුත් ලෝකයේ රටවල් පරිභෝජන දරිද්‍රතාව මැනීම සඳහා තම තමන්ට ආවේණික පෝෂණ මට්ටම් භාවිත කරයි.

ඒ අනුව ශ්‍රී ලංකාවේ පෝෂණ පදනම කැලරි 2145ක් වේ.

Classwork.LK

# මානව දරිද්‍රතාව

නිදහස, ආත්ම ගරුත්වය හා අන්‍යයන්ගේ සැලකිල්ල භුක්ති විඳිමින් සෞඛ්‍ය සම්පන්න ව සතුටුදායක ජීවන තත්ත්වයක් ගත කිරීම සාක්ෂාත් කර ගැනීමට අදාළ මානව සංවර්ධනය සඳහා ඇති ඉඩ ප්‍රස්තා හා තේරීම් අහිමි වී ගිය තත්ත්වයක් මානව දරිද්‍රතාව ලෙස හැඳින්වේ.

මානව දරිද්‍රතා දර්ශකය මගින් මැනීමට උත්සාහ කරනුයේ මානව සංවර්ධනයට අහිතකර ලෙස බලපාන විචල්‍යය වේ.

දීර්ඝායුෂ නොමැති වීම. දැනුම නොමැති වීම, හා යහපත් ජීවන තත්ත්වයක් නොලැබීම යන සාධක පදනම් කර ගනිමින් මානව දරිද්‍රතා දර්ශකය සකස් කර ඇත.

Classwork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති
## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura